සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Ad/05/SDO-EB 2020 | ඔබේ අංකය / உமது இல / Your No: ........................................ | දිනය / திகதி / Date: 2021.07.07 |

සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/සහකාර අධ්‍යක්ෂවරුන් වෙත.

**<u>සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වීම මත වැටුප් වර්ධක ලබාදීම.</u>**

මෙම දෙපාර්තමේන්තුවේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2015.12.17 දින අනුමත කරඇති බඳවා ගැනීම් පටිපාටියේ විධිවිධානවලට අනුව III වන ශ්‍රේණියට බඳවාගත් නිලධාරියෙකු පත්වීමේ දිනසිට වසර 03ක් ගතවීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු අතර එම කාර්යක්ෂමතා කඩඉම් විභාගය වසරකට දෙවරක් පැවැත්විය යුතුය.

02. එමෙන්ම මෙම නිලධාරීන් සඳහා සමෘද්ධි අධිකාරිය විසින් නිකුත් කර ඇති පත්වීම් ලිපිවල 03වන වැටුප් වර්ධකයට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු බව සඳහන් වුවත් සමෘද්ධි අධිකාරියේ පැවති බඳවාගැනීම් පටිපාටියේ හෝ ඔවුන් වෙත නිකුත් කර ඇති පත්වීම් ලිපියේ හෝ විභාගය පැවැත්විය යුතු වාර ගණන සඳහන්ව නැත. කෙසේ වුවද දැනට අනුමත බඳවා ගැනීම් පටිපාටියට අනුව මෙම නිලධාරීන් නියමිත කාර්යක්ෂමතා කඩඉම අසමත් වීම හේතුවෙන් අන්තර්ග්‍රහණය කර ඇත්තේද III ශ්‍රේණියටය.

03. දෙපාර්තමේන්තුවේ දැනට පවත්නා තොරතුරුවලට අනුව මෙම විභාගය සමෘද්ධි අධිකාරිය විසින් 2001, 2003, 2007, 2011 හා 2012 වසරවල අවස්ථා 05කදී පවත්වා ඇති අතර මෙම දෙපාර්තමේන්තුව විසින් 2021 ජනවාරි 23 දින පවත්වා ඇත. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බඳවා ගැනීම් පටිපාටියට අනුව වසරකට දෙවතාවක් විභාගය පැවැත්විය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එලෙස කටයුතු කර නොමැති අතර සමෘද්ධි අධිකාරිය විසින්ද ප්‍රමාණවත් පරිදි විභාග පවත්වා නොමැති බව නිරීක්ෂණය වේ.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887** |
| | | **Hot Line :0112-889007** | | | |

c:\users\user\downloads\වැටුප් වර්ධක ලබාගැනීම.doc

04. ඉහත සඳහන් කරුණු අනුව මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා අදාළ නිලධාරින්ට ප්‍රමාණවත් අවස්ථා නොලැබී ඇති බව නිරීක්ෂණය වන බැවින් සියළුම නිලධාරින්ට මෙම විභාගය සමත්වීම සඳහා අවස්ථා 06 නොලැබීම මෙම නිලධාරින්ගේ පාලනයෙන් තොර කරුණක් වන බැවින් ඔවුන් කාර්යක්ෂමතා කඩඉම සමත් වීම සඳහා ඉදිරිපත්ව ඇති 6වන අවස්ථාව දක්වා අදාළ වන පරිදි ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 11.9 වගන්තිය යටතේ හා/හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති VIII වන පරිච්ඡේදයේ 101 වගන්තියේ විධිවිධාන පරිදි පරිවාස කාලය දීර්ඝ කර, නියමිත දිනට සේවයේ ස්ථිර කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව මෙයින් දන්වමි.

05. ඒ අනුව මෙම නිලධාරින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්වූ 6 වන අවස්ථාව 2021.01.23 දිනවන බැවින් ඒ දක්වා ඔවුන්ගේ වැටුපට හෝ ජ්‍යෙෂ්ඨතාවයට හානියක් සිදු නොවන බැවින් ඒ අනුව වැටුප් ගැළපීමට කටයුතු කරන ලෙසද වැඩිදුරටත් මෙයින් දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්,

| | | |
|---|---|---|
| 01. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.ස. |
| 02. ප්‍රධාන ගණකාධිකාරි | - | අ.ක.ස. |
| 03. ප්‍රධාන අභ්‍යන්තර විගණක | - | අ.ක.ස. |
| 04. නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආයතන) | - | අ.ක.ස. |
| 05. පරිපාලන නිලධාරි (පාලන අංශය) | - | අ.ක.ස. |